සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය	**සිංහල භාෂාව හා සාහිත්‍යය I -II**	කාලය / நேரம் / Time: පැය තුනයි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සැලකිය යුතුයි:

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ප්‍රධානීන් තමන්ගේ **අත්-පා බැඳ** තිබෙන බව සේවකයෝ පවසති.
   (1) වස්තුව පැහැර ගෙන (2) නිදහස නැති කොට
   (3) සිත් පීඩාවට පත් කොට (4) දෙපා ගැට ගසා

2. ඔහු තම මිතුරන්ට **හිත-බඩ පිරෙන තෙක්** සංග්‍රහ කළේ ය.
   (1) මහත් සොම්නසට පැමිණෙන තෙක් (2) කුසගිනි නිමා වන තෙක්
   (3) නැවත ආහාර හිඟ නොවන පරිදි (4) අතැති මුදල් අවසන් වන තෙක්

3. එම කාර්යාලය **හොර ගුහාවක්** බවට සේවාදායකයෝ චෝදනා කරති.
   (1) සොරුන් සැඟවී සිටින ස්ථානයක් (2) සොරකම් කළ ද්‍රව්‍ය සඟවා ඇති ස්ථානයක්
   (3) කාලය නාස්ති කරන තැනක් (4) කපටි වැඩ කරන තැනක්

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින් මුද්‍රිත** කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

4. නූතන කවීහු අපූරු **කාව්‍යෝක්ති** භාවිත කරති.
   (1) කාව්‍ය ආකෘති (2) කාව්‍ය අලංකාර (3) කාව්‍යමය කියමන් (4) කාව්‍යමය වචන

5. ශාස්ත්‍රකාමී ශිෂ්‍යයෝ **ස්වාධ්‍යායනය** කෙරෙහි යොමු වෙති.
   (1) තමාගේ කැමැත්ත (2) තමාගේ නිදහස (3) තමා ම ඉගෙනීම (4) තමා ම අධීක්ෂණය

6. ආගමික නායකයන්ගේ **අනන්තාපරිමාණ** ගුණ බැතිමත්තු සිහිපත් කරති.
   (1) සීමා සහිත හා පරිමා කළ හැකි (2) සීමාවක් හෝ ප්‍රමාණයක් නොමැති
   (3) ප්‍රමාණය නිවැරදි ව පැවසිය නොහැකි (4) නොයෙක් ආකාරයෙන් පැවසිය හැකි

7. සැම පදයක ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) පෘෂ්ටය, ප්‍රවණතා, අධ්‍යාත්මික, කනිෂ්ඨ (2) සංක්‍රමණ, කණගාටුව, විමර්ශන, වෛරය
   (3) කුරුලු, ධාරානිපාත, මර්දනය, කල්‍යාණ (4) ශෛලිය, නිශ්පල, ප්‍රභවය, සීඝ්‍රගාමී

Past Papers Wiki

8. භූෂණ, භාෂණ, භෞතික, භීෂණ යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) දීර්ඝ ඇදය, ඇලපිල්ල, ගැට ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල
   (2) දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඇදය, කොම්බුව හා ගයනුකිත්ත, දීර්ඝ පාපිල්ල
   (3) දීර්ඝ පාපිල්ල, කෙටි ඇදය, කොම්බුව හා ගයනුකිත්ත, දීර්ඝ ඉස්පිල්ල
   (4) දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, දීර්ඝ ඉස්පිල්ල

9. 'පියීකා' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
   (1) ඕෂ්ඨ්‍ය, මූර්ධ්‍ය හා කණ්ඨ්‍ය ය.
   (2) කණ්ඨ්‍ය, දන්ත්‍ය හා මූර්ධ්‍ය ය.
   (3) ඕෂ්ඨ්‍ය, තාලුජ හා කණ්ඨ්‍ය ය.
   (4) දන්ත්‍ය, තාලුජ හා ඕෂ්ඨ්‍ය ය.

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) පිල්ලෑව, මාධුර්ය, විධායක, නිමේෂය
   (2) ආක්‍රමණ, පෙළහර, කිංකිණි, ප්‍රකම්පන
   (3) පුස්තක, බරණැස, වියෝජක, සම්බාධක
   (4) ඒකරාශී, දුර්වර්ණ, ගිම්හාන, උද්භිද

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) රචකයකු, බිසවක්, ජීවින්, සෙබළියක
   (2) වෘකයෝ, ගෘහණියක්, අපි, රීතීහු
   (3) පණ්ඩිතයන්, නැවියන්, මිත්‍රයකු, යක්කු
   (4) පාලකයකු, බුද්ධිමතුන්, ඔවුන්, බාලිකාවක

12. "ශ්‍රී ලාංකිකයෝ සංචාරකයන්ට මැනවින් සංග්‍රහ කරති" යන වාක්‍යයෙහි 'සංචාරකයන්ට' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) සම්ප්‍රදාන
   (2) සම්බන්ධ
   (3) ආධාර
   (4) කර්ම

13. 'තිනෙත්' යන්න අයත් වන සමාසය කුමක් ද?
   (1) අව්‍යය
   (2) අන්‍යාර්ථ
   (3) විශේෂණ
   (4) විභක්ති

14. 'නිපුණ + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) නේපුණ්‍ය
   (2) නිපුණය
   (3) නිපුණත්ව
   (4) නෛපුණ්‍ය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) විධික්‍රියා - කරව, බලව, කැටුව, අසව
   (2) නිපාත - හෙයින්, බැවින්, ඉතින්, පටන්
   (3) කෘදන්ත - විසුරුණු, පැතිරුණු, රැකුණු, කැඩුණු
   (4) අව්‍යය සමාස - නිස්සාර, නිශ්ශබ්ද, නිෂ්ඵල, නිර්මල

16. පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) සොරු නිතර ගම් වදිමින් ගෙවල් බිඳිති.
   (2) ගම්වැසියන් තොරතුරු පවසද්දී නිලධාරියා අසා සිටියේ ය.
   (3) බියපත් ගම්වැසියෝ නිවාසවලට වැදී දොරගුල් දැමූහ.
   (4) දිය සිඳුණු ගඟ ඇදි ඇදී ගලා ගියේ ය.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

17. විවාදයේ දී ශිෂ්‍යයන් ඉදිරිපත් කළ කරුණුවල ..... විනිසුරුවන්ගේ ප්‍රශංසාවට ලක් විය.
   (1) නීත්‍යානුකූලභාවය
   (2) ප්‍රතිකූලභාවය
   (3) තර්කාන්විතභාවය
   (4) නිරර්ථකභාවය

18. ස්වාභාවික ..... කළමනාකරණයේ දී පෙර සූදානම ඉතා වැදගත් වේ.
   (1) ව්‍යර්ථ
   (2) ව්‍යසන
   (3) ව්‍යාධි
   (4) ව්‍යාකූල

19. මාසික රැස්වීම අවසානයේ සභාපතිවරයා එදින සාකච්ඡා වූ කරුණු ..... කළේ ය.
   (1) සමාලෝචනය
   (2) සමාරෝපණය
   (3) සමාරම්භ
   (4) සම්ප්‍රාප්ත

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයක් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   (1) අධ්‍යක්ෂණය, පිටපත, නිෂ්පාදනය, රංගනය
   (2) ආමන්ත්‍රණය, දිනය, මාතෘකාව, අත්සන
   (3) බීජ, අස්වැන්න, රෝපණය, කුඹුර
   (4) අස්රිය, වපසරිය, දුම්රිය, කරත්තය

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අශ්ව-හය, නායක - නා, ජලය - ජගත්, වංශය - ගෝත්‍රය
(2) හරසර - බුහුමන්, තුමුල - විශාල, විකසිත - මිණිමුතු, සහසැස් - ශක්‍ර
(3) සාමුව - මිග, සතොස - හර්ෂය, දිනකර - හිමකර, අහස - සියොත්මග
(4) ධාවක - බාධක, වර්ෂය - දශකය, උපත -දිනුම, වුවන - වක්ත්‍රය

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) කුරුලු - විහඟ, පක්ෂි, ද්විජ, දද
(2) නිතර - නිති, සතත, අනවරත, නිරන්තර
(3) තොල් - ලවන්, ඕෂ්ඨ, ඔට, අදර
(4) ගෙය - ගෘහය, ඝරය, උද්‍යානය, නිවාසය

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) අගාරික - අනගාරික (2) චංචල - නිශ්චල (3) පිළිමල් - ප්‍රතිමල්ල (4) සුප්‍රකට - කුප්‍රකට

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'ගුරුතුමා' යනු පරස්වර ලෝප සන්ධි පදයකි.
(2) 'බලද්දී' යනු කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයකි.
(3) සඤ්ඤක අක්ෂර, අර්ධ අනුනාසික අක්ෂර නමින් ද හැඳින්වේ.
(4) 'තොපි' යන්න මධ්‍යම පුරුෂ, බහු වචන, අනුක්ත, සර්ව නාම පදයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරින් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) රටක මාර්ග පද්ධතියෙන් නඩත්තුව බලුන් කිරීම අත්‍යවශ්‍ය ය.
(2) මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහි වන සියලු පාර්ශ්වවල සහය අප ලබා ගත යුතු ය.
(3) නවෝත්පාදන බිහි කිරීමෙන් කාර්මික සංවර්ධනයට වේගවත් කළ හැකි ය.
(4) අධික වර්ෂාව හා සුළං හේතුවෙන් ප්‍රදේශ රැසක ජනතාවට පීඩාවට පත් වූහ.

- අංක **26, 27** ප්‍රශ්නය යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. ගතිගුණ වෙනස් කරන්නට බැරි වීම
(1) කොටියාගේ පුල්ලි මකන්නට බැරි වීම.
(2) කාගේ කාගේ කිල්ලෝටෙත් හුණු තියනවා ලු.
(3) කණ කොකාගේ සුද පේන්නේ ඉගිලෙන කොට ලු.
(4) කිඹුල් පැටවුන්ට පිනන්න උගන්වනවා වගේ.

27. කලාතුරකින් යමක් සිදු වීම.
(1) පය බරවායට පිටි කර බෙහෙත් බැන්දා වගේ.
(2) කටු ගාලේ පිපුණු මල වගේ.
(3) ගඟ මැද දී ඔරුව පෙරළුණා වගේ.
(4) කණ කැස්බෑවා විය සිදුරෙන් එළිය බැලුවා වගේ.

28. ආගම සන්ධියට හා ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පිරියම්, ගෙවුයන් (2) ගංතෙර, ගෙවුයන්
(3) පිරියම්, ගංතෙර (4) ගෙවුයන් , ගංතෙර

- අංක **29, 30** දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) ශිෂ්‍යයෝ පාසලට පැමිණ ඇත.
(2) අප විභාගය සමත් වෙති'යි ගුරුවරු සිතති.
(3) සාමාජිකයෝ රැස්වීමට නොපැමිණියේ ඇයි?
(4) සභාපතිවරයා හෝ සභාපතිවරිය රැස්වීම අමතන්නේ ය.

30. (1) ඔවුන් දක්ෂ ලේඛකයෝ වෙති
(2) සිංහල ෂෙලී නොහොත් එච්.එම්. කුඩලිගම ප්‍රතිභාපූර්ණ කවියෙකි.
(3) නිලධාරීහු සේවකයන් සමඟ සාකච්ඡා කළහ.
(4) ඇතැමෙක් සත්පුරුෂයෝ ලෙස පෙනී සිටිති.

- අද වැසි දිනයක් ..... සිසුන් පාසලට පැමිණ ඇත.
- මෙරට ආර්ථික වර්ධනය ..... සංචාරක ව්‍යාපාරය ප්‍රබල දායකත්වයක් සපයයි.
- මහජනතාවගෙන් ලැබුණු තොරතුරු ..... පොලිසිය පරීක්ෂණ මෙහෙයවයි.
- දෙමාපියෝ ..... දරුවන්ගේ ආරක්ෂකයෝ වෙති.

31. ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) නමුදු, ඔස්සේ, උදෙසා, වනාහි (2) ඔස්සේ, වනාහි, උදෙසා, නමුදු
(3) නමුදු, උදෙසා, ඔස්සේ, වනාහි (4) ඔස්සේ, උදෙසා, නමුදු, වනාහි

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මම වෙන දවසක ගොඩවෙන්නන්"
(1) මම වෙනත් දිනයක පැමිණෙන්නෙමි. (2) මා වෙනත් දිනයක පැමිණෙන්නෙමි.
(3) මා නැවත පැමිණිය යුතු ය. (4) මම නැවත නොපැමිණෙන්නෙමි.

33. " .... වාලධිය අමුඩු හස්සෙහි ගන්වා ගෙන වක ගස ගසා සොඬ හකුළ හකුළා ශ්‍රී පාදය සොඬින් පිරිමැද මැද බුදුන් පාමුල්හි වැද හොත්තේ ය."
ඉහත ගද්‍ය පාඨයේ අන්තර්ගත අලංකාරය වන්නේ,
(1) උපමා ය. (2) අනුප්‍රාසය ය. (3) එළිසමය ය. (4) රූපක ය.

34. 'උපදේශ සාහිත්‍යය' ගණයට අයත් **නොවන** ග්‍රන්ථය කුමක් ද?
(1) පංචතන්ත්‍රය (2) හිතෝපදේශය (3) කව්සිළුමිණ (4) තිරුක්කුරළ්

35. 'අන්දරේලා', 'කනේරු මල්', 'සඳගිර' යන නාට්‍ය නිර්මාණවල රචකයා වන්නේ,
(1) ජයලත් මනෝරත්න ය. (2) දයානන්ද ගුණවර්ධන ය.
(3) කේ. බී. හේරත් ය. (4) සයිමන් නවගත්තේගම ය.

36. පහත සඳහන් කවියෙහි තුන්වන පදය තෝරන්න.
තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද - වර සුර පුරෙහි වත් නො වසති නිරය ලෙ ද
..... - සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ
(1) වගක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද (2) සපෙක් එකකු කැව නසිනේ ඔහු ම ව ද
(3) ගොර තර නිරෙහි වත් පරනට වැඩ ඇති ද (4) අනෙක් ලොවින් නො නැසෙයි සතෙකුත් එක ද

37. 'තුදුස්' හා 'චිරස්ථිතිය' යන පදවල අදහස නිවැරදි ව අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) දහ හතර, බොහෝ කල් පැවතීම (2) සතරැස්, ආරක්ෂා කිරීම
(3) දහ හතර, ආරක්ෂා කිරීම (4) ආරක්ෂා කිරීම, සතරැස්

38. උඩරට උපභාෂාවේ 'ඇම්බරයා' යනු,
(1) පිරිමි ළමයා ය. (2) හිතුවක්කාරයා ය. (3) මී හරකා ය. (4) බිරිඳ ය.

39. "මා නිරතව සිටි කර්තව්‍යය වන විශ්වවිද්‍යාලයක් ගොඩනැංවීම කිසියම් අයෙකුට භාර දිය හැකි වටිනාම කර්තව්‍යයක් වේ." මේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් (2) මහාචාර්ය සේනක බිබිලේ
(3) ආචාර්ය ටී.බී. ජයා (4) ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර

40. පහත සඳහන් පාඨයේ අදහසට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
මනුෂ්‍යයා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ගෙන් වෙන් කරන කරුණු අතුරෙන් වැදගත් කරුණක් වන්නේ තම අද්දැකීම්වලින් මෙන් ම අන්‍යයන්ගේ අද්දැකීම්වලින් ද ඵල ලැබීමේ හැකියාව යි.
(1) ස්වකීය අද්දැකීම් මෙන් ම අන්‍යයන්ගේ අද්දැකීම් ඵලදායි කාර්යයන් සඳහා භාවිත කිරීමේ හැකියාව මිනිසා සතු ප්‍රබලතාවයකි.
(2) මිනිසා සත්ත්ව ලෝකයේ අනෙකුත් සාමාජිකයන්ගෙන් වෙනස් වන කරුණ සැලකීමේ දී ස්වකීය මෙන් ම අන් අයගේ අද්දැකීම්වලින් ප්‍රයෝජන ලැබීමේ ශක්‍යතාව එක් වැදගත් කරුණකි.
(3) සත්ත්ව ලෝකයේ අනෙකුත් සත්ත්වයන්ට තමාගේ හෝ අන් අයගේ අද්දැකීම්වලින් ජීවිත ආදර්ශ ලබා ගත නොහැකි නිසා මිනිසා ප්‍රබලයකු බවට පත් ව ඇත.
(4) මිනිසා ද සත්ත්ව ලෝකයේ සාමාජිකයෝ ද තමාගේ මෙන් ම අන් අයගේ අද්දැකීම් භාවිතයෙන් ප්‍රයෝජන ලබා ගනිති.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම / பெயர் / Name } .....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....

- ප්‍රශ්න **සියල්ලට** ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

---

01. (i) සිට (x) තෙක් ඇති **සියලු** ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,
(අ) ඌෂ්මාක්ෂරයක් ලියා දක්වන්න.
(ආ) අන්තඃස්ථාක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද දෙකක් ලියන්න.
ලිපිකරුවා කාර්යාලයට ලැබුණු ලියුම් පිළිබඳ තොරතුරු පොතක සටහන් කළේ ය.

(iii) පහත සඳහන් පද විසන්ධි කරන්න.
(අ) සුරත (ආ) අභ්‍යවකාශ

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කොට ලියන්න.
සමිතියේ ලිපි ගොණු පරීක්ෂා කළ ගණන් පරීක්ෂකවරයා ගනුදෙනු පිළිබඳ විධිමත් විමර්ෂනයක් සිදු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන්නේ ය.

(v) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) සංග්‍රහය (ආ) ඌන

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) මැනවින් ආරක්ෂා කිරීම (ආ) වැඩිහිටියන් ලබා දෙන උපදෙස්

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ඕ තොමෝ ගමට ගියහ. (ආ) ක්‍රීඩිකාවෝ සිවු දෙනෙකු රන් පදක්කම් දිනූහ.

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) විදුහල්පතිතුමා ජයග්‍රහණ ලැබූ ශිෂ්‍යයන් අගය කළේ ය.
(ආ) වාරි ඉංජිනේරුවෝ නව වාරි පද්ධතියක් සැලසුම් කරති.

(ix) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) රජය විශේෂඥයන් ලවා සැලසුම් **සකස් කරවයි.**
(ආ) දරුවෝ යහපතෙහි **හැසිරෙත්වා!**

(x) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමඟ දෙවන වචනය නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කොට ලියන්න.
(අ) මාර්ග වැනුම (ආ) දිගු වාක්‍ය (ලකුණු 2×10=20 යි.)

PAST PAPERS WIKI

2) පහත දැක්වෙන **(අ) (ආ). (ඉ). (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) සමාජ ප්‍රගතිය හා ස්ථාවර පැවැත්ම සඳහා සාරධර්ම අත්‍යවශ්‍ය වන අතර මිනිසාගේ ශිෂ්ටත්වය රඳා පවතින්නේ අදාළ සමාජය මත සම්මත වූ සාරධර්ම පද්ධතිය මගිනි. අද සමාජයේ මෙබඳු සාරධර්ම බැහැර කිරීම හේතුවෙන් පුද්ගල ගැටුම්, පවුල් ගැටුම්, සමාජ ගැටුම් හා විවිධ ව්‍යසනකාරී තත්ත්ව දිනෙන් දින උත්සන්න වෙමින් පවතී. ආගම, අධ්‍යාපනය ආදියට අමතර ව සාරධර්ම සමාජගත කිරීමට සාහිත්‍ය පත පොතෙන් ලැබෙනුයේ මනා පිටුබලයකි. සාරධර්ම සමාජගත කිරීම සඳහා සාහිත්‍ය නිර්මාණවල දායකත්වය ලබා ගැනීම කාලෝචිත ය.

(ආ) සංචාරක කර්මාන්තය යනු මෙරට ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් සපයන ප්‍රධාන ක්ෂේත්‍රයක් වුව ද එහි අනිසි කළමනාකරණය හේතුවෙන් වෙරළ දූෂණය ඉහළ යමින් පවතී. අනවසර ඉදිකිරීම්, සංචාරක හෝටල් මෙන් ම ඒ ආශ්‍රිත ආයතනවලින් බැහැර කරන අපජලය සහ කසළ නිසි පරිදි බැහැර නොකිරීම, සංචාරකයන්ට විධිමත් ව අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවේදයක් සකසා නොතිබීම ආදිය මීට හේතු වී ඇත. මේ නිසා සමස්ත පරිසර පද්ධතියට ද සාගර ජීවීන්ට ද බරපතළ තර්ජනයක් එල්ල වී තිබේ. මෙබඳු ගැටලුවලින් අත්මිදී වෙරළ තීරයේ ස්වාභාවික සුන්දරත්වය සහ පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කිරීමට පියවර ගත යුතු ය.

(ඉ) පොල් යනු දේශීය ජනතාවට අත්‍යවශ්‍ය ආහාරයක් මෙන් ම බොහෝ දේශීය කර්මාන්ත සඳහා භාවිත කරන අමුද්‍රව්‍යයක් ද වේ. අගය එකතු කළ නිෂ්පාදන ක්‍රියාවලියක් හරහා විශාල විදේශ විනිමයක් උත්පාදනය කළ හැකි ආර්ථික භෝගයක් ලෙස ද පොල් හඳුනා ගෙන තිබේ. එහෙත් පළිබෝධ හා රෝග, වගා ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම, දේශගුණික විපර්යාසය, නාගරීකරණය යනාදී හේතු නිසා පොල් වගාව බරපතළ අභියෝග රැසකට මුහුණ පා ඇත. වැඩි අස්වැන්නක් දෙන දෙමුහුන් පොල් පැළ හඳුන්වා දීම, පළිබෝධ හා රෝග පාලනයට විද්‍යාත්මක විසඳුම් සෙවීම , නියමිත පොහොර නිසි පරිදි යෙදීම, පොල් ගස් කැපීම වැළැක්වීම, ගෙවතු වගාව දිරිගැන්වීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පොල් වගාවේ තිරසර බව තහවුරු කළ හැකි ය.

(ඊ) ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය උවදුර පැතිරීම ජාතික ව්‍යසනයක් බවට පත් ව ඇති අතර එයින් සිදු වන හානි අතිමහත් ය. කායික හා මානසික සෞඛ්‍යය පිරිහීම, ගෘහස්ථ හිංසනය, අපරාධ වර්ධනය වීම, ශ්‍රමබලකාය දුර්වල වීම, සෞඛ්‍ය වියදම ඉහළ යාම මෙන් ම සමාජ සුරක්ෂිතතාව බිඳ වැටීම යනාදි අහිතකර ප්‍රතිඵල රාශියකට මත්ද්‍රව්‍ය හේතු වී ඇත. ආරක්ෂක අංශ , රේගුව ඇතුළු රාජ්‍ය ආයතන ද කලාකරුවන්, ක්‍රීඩකයන් ආදි පිරිස් ද සම්බන්ධ කර ගනිමින් මත් උවදුර පරාජය කිරීමට රජය කටයුතු කරමින් සිටියි. සමස්ත සමාජය පීඩාවට පත් කරන මේ ව්‍යසනය පිටුදැකීම සඳහා අවශ්‍ය ප්‍රජාදායකත්වය සැපයීමට කටයුතු කිරීම සැම පුරවැසියකුගේ ම වගකීමකි. (ලකුණු 25 යි.)

3) පහත දැක්වෙන පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පෘතුගීසින්ගෙන් පසු ව ළං කොට ගත් ලන්දේසීන්ගෙන් ද සිදු වූයේ යහපතක් නො වේ. එය ඉහුරු දී මිරිස් ගත්තාක් වැනි විය. රෝමානුවෝ රටේ තැන තැන පදිංචි වූහ. රෝමානු පූජකවරු තැගි භෝග දෙමින් මහජනයා පමණක් නො ව රජවරුන් ද ආගමට හරවා ගැනීමට වෑයම් කළහ. වීරපරාක්‍රම, විජය රාජසිංහ රජවරුන් ගොන්සාල් වෙස්ගේ පොත් පිළිගැනීම නිසා මහජනයා අතර කැළඹීම් ඇති විය.

දේශපාලන වශයෙන් සිංහල බෞද්ධයනට අවාසි සහගත තත්ත්වයක් විය. අභ්‍යන්තර කැළඹිලි විද්වතුනට, භික්ෂූනට හා ජනතාවට අසහනය ගෙන දුන්නේ ය. අධ්‍යාපනික වශයෙන් සිදු වූ පරිහානිය යළි පුනරුත්ථාපනය කර ගන්නට බැරි තරම් විය. පිරිවෙන් නැති වී ගියේය. ආගමික හා ශාසනික වශයෙන් පැවති

දීප්තිය තුරන් විය. සංස්කෘතික හා සාහිත්‍යික වශයෙන් පැවති ප්‍රෞඪ බව - ආලෝකය රඳවා ගත නොහැකි විය. රට ජාතිය රැක ගැනීමේ උදාර හැඟීම් ඇති භික්ෂූන් හා උගතුන් කිහිප දෙනකු හෝ ගුරුගෙදර වැනි ආයතන මගින් දරුවන් ප්‍රබුද්ධ ව තබා ගන්නට වෑයම් කළහයි කිව යුතු ය. එමෙන් ම කවිකම ප්‍රගුණ කළවුන් විසින් රටේ පවත්නා තත්ත්වය හෙළිදරව් කිරීමේ වෑයමක ද යෙදුණු සේ පෙනේ. එමගින් ජනතාව ප්‍රබුද්ධ ව තබා ගැනීමටත් ආගමික දැනුමින් යහපත් පැවැත්මකට යටත් පිරිසෙයින් මිථ්‍යා දෘෂ්ටිකයනට නොරැවටී ඉන්නට කටයුතු සලස්වා ගන්නටත් මෙම කවීනට වුවමනා කළ බව පෙනේ. (ලකුණු 10 යි.)

4) පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අවුරුදු දෙදහස් පන්සියයකට අධික කාලයක පටන් බහුතර දේශීය ජනතාවගේ සංස්කෘතිය පෝෂණය වූයේ බුදුසමයෙන් ලත් ආභාසය තුළිනි. බෞද්ධ සංස්කෘතිය පදනම් කොට ගොඩනැගුණු දේශීය ජන ජීවිතය චතුර්විධ පුරුෂාර්ථයක් අරමුණු කොට ඇත්තකි. ආර්ථික, ධාර්මික, විද්‍යාත්මක හා කලාත්මක වශයෙන් ජනතාවගේ සංවර්ධනය සැලසීම බෞද්ධ සංස්කෘතියේ මුඛ්‍ය පරමාර්ථය යි. අර්ථයත් ධර්මයත් එක සේ සංවර්ධනය කිරීම අංග සම්පූර්ණ ජීවිතයකට අවශ්‍ය බව දේශීය ජීවන දර්ශනය පිළිගත් මූලික ජීවිතයක සිද්ධාන්තයකි. පැරණි සිංහල සංස්කෘතියේ වැව් අමුණු මගින් අර්ථය පිළිබිඹු වන අතර, විහාර දාගැබ මගින් ධර්මය පිළිබිඹු වන බව පැහැදිලි ව පෙනෙන්නට තිබේ. ධාර්මික ගුණවගාවට පදනමක් වශයෙන් ආර්ථික විමුක්තිය ජනතාවට සලසාලීම පාලක පක්ෂයේ යුතුකම බව දේශීය සම්ප්‍රදායගත සංස්කෘතිය මගින් පිළිගනු ලැබී ය. ඒ සඳහා රට සමෘද්ධිමත් කිරීමට දේශීය ස්වාධීනත්වය අවශ්‍ය බවත්, මීට පදනම් වශයෙන් දෙස, බස, රැස, හා සාමය ආරක්ෂා කළ යුතු බවත් රජු ප්‍රමුඛ ජනතාව පිළිගත්තහ. දෙස, බස රැස හා සාමය යම් කලෙක සුරක්ෂිත වී ද, එකල දේශීය සංස්කෘතියේ සෞභාග්‍ය උදා වූ බවට ලංකා ඉතිහාසය දෙස් දෙයි. දෙස, බස, රැස හා සාමය යම් කලෙක විදේශීය ආක්‍රමණයන්ට ගොදුරු වී ද එකල දේශීය සංස්කෘතියේ පරිහානිය හා අවනතිය සිදු වූ බවට ද ලංකා ඉතිහාසය එසේ ම දෙස් දෙයි.

1. දේශීය සංස්කෘතිය පෝෂණය වීමට බලපෑ සාධකය කුමක් ද?
2. දේශීය ජන ජීවිතයට පදනම් වූ චතුර්විධ පුරුෂාර්ථ කවරේ ද?
3. දේශීය ජීවන දර්ශනය පිළිගත් මූලික සිද්ධාන්තය කුමක් ද?
4. පැරණි සිංහල සංස්කෘතියේ අර්ථය පිළිබිඹු කෙරෙන සංකේත මොනවා ද?
5. දේශීය සංස්කෘතිය පිරිහීමට බල පෑ හේතුව කුමක් ද? (ලකුණු 2×5=10 යි.)

5) පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. (වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)

- සියපතගම ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි.
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ පිරිසිදු කිරීමේ වැඩසටහන් මාලාවක් දියත් කළ යුතු බව
- මේ යටතේ නොදිරන කසළ එකතු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු බව
- එය දෙසැම්බර් මස 22 දින පෙ. ව. 8.00 සිට ප.ව. 5.00දක්වා ප්‍රාදේශීය සභා භූමියේ දී පැවැත්විය යුතු බව
- වීදුරු බෝතල් සහ කටු, බල්බ්, ප්ලාස්ටික් වර්ග, හිස් වතුර බෝතල්, පොලිතින්, රූපවාහිනී යන්ත්‍ර, විදුලි පරිපථ, පරිගණක යනාදි ද්‍රව්‍ය එක්රැස් කරන බව
- කසළ වෙන් කර රැගෙන ඒමට ප්‍රදේශවාසීන් දැනුවත් කළ යුතු බව

නැතහොත්

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් "පොත් කියවමු - ලොව ජයගමු" යන තේමාව යටතේ විජය ආදර්ශ විදුහල සංවිධානය කර තිබූ පුස්තකාල දින වැඩසටහනට සහභාගී වූ වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

- දිනය : 2025 ඔක්තෝම්බර් 25
- වේලාව : පෙ.ව. 9.00
- ස්ථානය : විද්‍යාලයීය ප්‍රධාන ශාලාව
- ප්‍රධාන ආරාධිතයා : ප්‍රවීණ ලේඛක යසස් වීරසේකර මහතා
- ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව : පුස්තකාල සංවර්ධනය කිරීමේ වැදගත්කම, පොත්පත් ඇතුළු හරවත් කියවීමේ ද්‍රව්‍ය තෝරා ගෙන කියවීමෙන් සමබර පෞරුෂයකින් හෙබි සංවේදී දරුවකු බිහි වෙයි.
- විදුහල්පතිතුමාගේ කතාව : සැම දරුවකුට ම කියවීම යාවජීව පුරුද්දක් බවට පත් කිරීම වැඩසටහනේ අරමුණයි.
- සියපතගම සමූහ වාර්තාකරු සමන් විජේසිංහ ඔබ යැයි සිතන්න.

වැඩසටහනට සමගාමී ව සංවිධානය කර තිබූ තරගාවලියේ ජයග්‍රාහකයන්ට තිළිණ ප්‍රදානය කිරීම ද පුස්තකාලය සඳහා පොත්පත් පරිත්‍යාග කිරීම ද මෙහි දී සිදු විය. දෙමාපියන්, ආදි ශිෂ්‍යයන් ඇතුළු පිරිසක් මේ උත්සවය සඳහා සහභාගි වී සිටියහ. (ලකුණු 15 යි.)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය	**සිංහල භාෂාව හා සාහිත්‍යය - III**	කාලය / நேரம் / Time: පැය තුනයි

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No: .....

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න
- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත් උත්තර සපයන්න.**
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන **80**කි.

---

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "මං දැන් හොඳට ම වයස මිනිහෙක් "
(අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුද?
(ආ) ශ්‍රවණය කිරීමෙන් අනතුරු ව ගමන් කළේ කවර ස්ථානයකට ද?

(ii) රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑමුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
.....

(අ) ඉහත කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) ජන කවිය පිළිබඳ ඓතිහාසික තොරතුරු සඳහන් පැරණිතම යුගය කුමක් ද?

(iii) **(අ)** 'කාව්‍යාදර්ශයේ' රචකයා කවුද?
(ආ) පැරණිතම සිංහල සිව්පද කාව්‍ය ග්‍රන්ථ දෙකෙහි නම් ලියන්න.

(iv) අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් සොඳ
රස මුසු බසිනා
(අ) ඉහත උද්ධෘතය ඇතුළත් නිර්මාණයේ රචකයා කවුද?
(ආ) ඔහු විසින් රචිත නවකතා දෙකක් ලියන්න.

(v) (අ) 'අමාවතුර' රචනා කළේ කවුද?
(ආ) එම ග්‍රන්ථය රචිත අවධිය කුමක් ද?

(vi) දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මව් දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ

(අ) මෙම පද්‍ය බණ්ඩයට අනුව අතීත මිනිසුන්ගේ උදාර කාර්යයක් ලියන්න.
(ආ) මේ පද්‍ය නිර්මාණය කළේ කවුද?

(vii) "කුණු ඉස්පැට්ටර නිකෝනිස්කාරයගේ ගෙදෙට්ට ගිහින් ඇහුවලු 'කක්කුස්සියක් තියෙනවද?' කියල."
(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද?
(ආ) 'අතීරණය', 'වජීර පබ්බත' කවරකුගේ නිර්මාණ ද?

Past Papers Wiki

(viii) ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
.....
නැළවෙන බව සිතනු පුතේ

(අ) ඉහත කවියේ තුන්වන පදය සම්පූර්ණ කරන්න.
(ආ) දෙවන පේළියේ අන්තර්ගත කාව්‍යාලංකාරයක් ලියන්න.

(ix) "ඔහුගේ නැටීම් දක්නා නිසා බොහෝ දෙන රැස් වෙති."
(අ) මෙහි 'ඔහු' යනුවෙන් හඳුන්වන තැනැත්තා කවුද?
(ආ) මෙසේ සිතන්නේ කවුද?

(x) "මෙකී තුනින් මට යමක් රුචි වී නම් ඒ දෙමි;"
(අ) මෙහි සඳහන් පුද්ගලයාට රුචි වූ දෙය කුමක් ද?
(ආ) මේ උද්ධෘතය ඇතුළත් ග්‍රන්ථය සඳහා මූලාශ්‍රය වූ කෘතිය කුමක් ද? (ලකුණු 2 X 10 =20 යි.)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ම හ නි ල මි න් සිටි නා දොඹ නී පියල
පි ය ස ල මි න් මලගෙහි කෙළෑ රොනින'වල
ත තු ඩ ල මි න් බිඳෑ **විලිකුන්** මියුරු පල
ඉ සි ඹු ල මි න් යෙහි සැළ! දඹ පඳුරුවල

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මුළු පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ii) **කන් කලු** වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දැල් කොලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළි රූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත කවියට අනුව වීණා නාදය නිසා සත්ත්වයන් හැසිරුණු ආකාරය කෙටියෙන් ලියන්න.

(iii) "නෝ අහුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳැ පෙරවැ පැවිජී වැ **පණිවා** ඇ පවිකමින් විරත ව එක් වෙලේ වළඳා **බඹසරවස්** රකැ සිල්වත් වැ කළණදහම් පුරා වසන්නාහු දිටිහි නම් ඔහුට කුමක් කෙරෙහි? "

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මේ උද්ධෘතය හා සබැඳි අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) "මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රග්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහරාජයකු මෙන් නො බව මැනව, දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනව,"
(අ) මෙහි අන්තර්ගත උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.
(ආ) උද්ධෘතය හා සබැඳි අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) "අලුයම් වේලේ ලොව බලන සේක් හුණදඬු අගට නැහෙන්නාට පෙරාතු ව තමන් වහන්සේගේ නුවණ නමැති හුණදඬු අග හුන්නවුන් දැක, වන්නේ කුමක් දෝ හෝ යි බලන සේක්"
(අ) මේ උද්ධෘතයෙහි ඇතුළත් රූපකාලංකාරය ලියන්න.
(ආ) මේ හා සබැඳි අවස්ථාව කෙටියෙන් ලියන්න. (ලකුණු 4 X 5=20 යි.)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. "උපදේශකත්වය යහපත් ව සිදුවීම හා නොවීම සමස්ත සමාජයට ම බලපෑම් කරයි."
   - කේවට්ට බමුණාගේ චරිතයත්
   - මහෞෂධ පඬිතුමාගේ චරිතයත්

ඇසුරු කර ගනිමින් නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

- චමත්කාරජනක වන පියසක අසිරිය
- සමාජ ආර්ථික තොරතුරු

මගින් විවිධ අවස්ථා වර්ණනා කිරීමට ''සැළලිහිණි සංදේශ'' කතුවරයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)

4.
   - චරිත නිරූපණය
   * අවස්ථා නිරූපණය

මනාව හැසිරවීම 'දියමන්තිමාලය' කෙටිකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

- සුබවාදී ප්‍රාර්ථනාත්
- පරාර්ථකාමී සිතිවිලිත්

අපූර්ව ලෙස සංකලනය කිරීම නිසා 'දැතේ කරගැට සිඹ සනසන්නට' කාව්‍ය පන්තිය රසවත් වූ ආකාරය එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- **5,6,7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. කුරහන් වගාවේ සැබෑ ස්වභාවය සරල බසින් සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීමට ජන කවියා සමත් වූ ආකාරය 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' කවි පන්තිය මගින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි.)

6. උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීම 'ජාතික තොටිල්ල' පැදි පෙළ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

7. "උපයුක්ත භාෂා ශෛලිය නිසා පාඨක සිත් ඇද බැඳ තබා ගන්නා රසවත් කතාවක් ලෙස 'අඟුල්මල් දමනය' අගය කළ හැකි ය." උදාහරණ **තුනක්වත්** දෙමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank